# 10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## 03 පාඩම

### සැකසුම හා ඉදිරිපත් කිරීම

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

### අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 3 පාඩම

# තෙරුවන ගුණ හැඳින ගනිමු

# තෙරුවන ගුණ හැඳින ගනිමු

**බෞද්ධයකු වීමේ පළමු පියවර වන්නේ,**

බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන සරණ යාම

- තෙරුවන සරණ යෑමේ පදනම සකස් වන්නේ ශ්‍රද්ධාව තුළිණි

## ශ්‍රද්ධාව යනු,

- තෙරුවන ගුණ දැන ඇති කර ගන්නා පැහැදීමයි

බෞද්ධයන් තෙරුවන් සරණ යා යුත්තේ,

ශ්‍රද්ධාවත් ප්‍රඥාවත් මුල් කර ගෙනය

# බුද්ධ රත්නය

## බුදුන් වහන්සේ බුද්ධ රත්නය ලෙස හැඳින්වීමට හේතුව

බුදුන් වහන්සේ ලොව උපන් ශ්‍රේෂ්ඨතම ශාස්තෘන් වහන්සේ වන නිසා, උන් වහන්සේගේ අගය අර්ථවත් කිරීමට බුද්ධ රත්නය හෙවත් බුදු රුවන ලෙස හැඳින්වේ.

# බුද්ධ රත්නයේ ගුණ කියැවෙන පාඨය

ඉතිපි සෝ භගවා අරහං
සම්මා සම්බුද්ධෝ
විජ්ජාචරණ සම්පන්නෝ
සුගතෝ ලෝකවිදූ
අනුත්තරෝ පුරිසධම්ම
සාරථී සත්ථා දේව
මනුස්සානං බුද්ධෝ
භගවා' ති

# බුද්ධ රත්නයේ ගුණ සිහිකරන "ඉතිපිසෝ" පාඨයේ පෙන්වා දී ඇති බුදුගුණ නවය

1. අරහං
2. සම්මා සම්බුද්ධෝ
3. විජ්ජාචරණ සම්පන්නෝ
4. සුගතෝ
5. ලෝක විදූ
6. අනුත්තර පුරිසධම්ම සාරථී
7. සත්ථා දේව මනුස්සානං
8. බුද්ධෝ
9. භගවා



රහසින්වත් පව් නොකළ හෙයින් ද, ක්ලේශයන් කෙරෙන් දුරු වූ හෙයින් ද, පූජාවට සුදුසු වූ හෙයින් ද මුනිඳුට අරහං යයි කියනු ලැබේ




අතීත, වර්තමාන, අනාගත යන තුන් කාලයේම ලොව ඇති සියලු ම දේ අතේ ඇති නෙල්ලි ගෙඩියක් සේ දැනගත් බැවින් බුදුන් වහන්සේ සම්මා සම්බුද්ධ නම් වන සේක




විද්‍යා ඥාන අට ද, චරණ ගුණ පසළොසෙ ද ඇති බැවින් බුදුන් වහන්සේ විජ්ජාචරණ සම්පන්න නම් වන සේක




යහපත් වූ ගමන් ඇති හෙයින් ද, සුන්දර වූ නිවනට පැමිණි හෙයින් ද, සුන්දර වූ වචන ප්‍රකාශ කරන හෙයින් ද බුදුන් වහන්සේට සුගත යැයි කියන් ලැබේ



තුන් ලොව ම නියම ආකාරයෙන් දැන, නොදන්නා වූ ලෝකයට දේශනා කළ බැවින් බුදුහු ලෝක විදූ නම් වන සේක




බුදුන් වහන්සේ සතු
ගුණයට සමාන හෝ
ඊට වැඩි කෙනෙකු
ලෝකයෙහි නැති
නිසා ද බ්‍රහ්ම, අසුර,
යක්ෂ ආදීන් දමනය
කර ශාන්තිය ලබාදුන්
හෙයින් ද බුදුන්
වහන්සේ පුරිස ධම්ම
සාරථී නම් වන සේක




හැම කල්හි ම
සත්ත්වයන් සසර
කතරින් එතෙර
කළ බැවින් තුන්
ලෝකයට ම ගුරු වූ
බුදුන් වහන්සේ
සත්ථා
දේවමනුස්සානං
නම් වන සේක



චතුරාර්ය සත්‍යය
තමාගේ නුවණින්
අවබෝධ
කරගෙන
කරුණාවෙන්
ප්‍රකාශ කළ
බැවින් බුද්ධ නම්
වන සේක



ධර්මය බෙදා දැක් වූ බැවින් ද, ගුණයන්ගෙන් යුතු බැවින් ද, භාග්‍යවත් වූ බැවින් ද බුදුන් වහන්සේ භගවා නම් වන සේක



# බුදුගුණ ආදර්ශයට ගැනීමෙහි ඇති වැදගත්කම

- අපට අප තුළ ඇති වන දුර්වලතා පාලනය කර ගත හැකි වීම.

උදා :-

- අරහං ගුණය ආදර්ශයට ගැනීම නිසා, පව් නොකිරීමෙන් සමාජයේ ගෞරවයට පාත්‍ර වීම.
- සැලකිලි, සත්කාර සම්මානාදියට පාත්‍ර වීම.

# ධර්ම රත්නය



# ධර්ම රත්නයේ ගුණ කියැවෙන පාඨය

ස්වාක්ඛාතෝ භගවතා
ධම්මෝ, සන්දිට්ඨිකෝ,
අකාලිකෝ, ඒහි
පස්සිකෝ,
ඕපනයිකෝ, පච්චත්තං
වේදිතබ්බෝ විඤ්ඤූහීති

## ධර්ම රත්නයේ ගුණ සිහිකරන "ස්වාක්ඛාතෝ " පාඨයේ පෙන්වා දී ඇති දහම් ගුණ හය

1. ස්වාක්ඛාත
2. සන්දිට්ඨික
3. අකාලික
4. ඒහි පස්සික
5. ඕපනයික
6. පච්චත්තං වේදී තබ්බෝ විඤ්ඤූහි

# දහම් ගුණ හය

ස්වාක්ඛාත

සත්ත්වයාගේ භව ගමන
නැවතීමට හේතුවන
ලෝකෝත්තර ධර්මය
දේශනා කරන ලද හෙයින් ශ්‍රී
සද්ධර්මය ‘ස්වාක්ඛාත’ ය

# දහම් ගුණ හය

සන්දිට්ඨික

තමා විසින් ම පිළිපැද ඇස් පනාපිට මෙලොව දීම ප්‍රතිඵල දැක ගත හැකි බැවින් ධර්මය සන්දිට්ඨික යි

# දහම් ගුණ හය

අකාලික

සෝවාන් ආදී සතර මාර්ග සද්ධර්මය කල් නොයවාම ඵලය උපදවන බැවින් ධර්මය අකාලික ය

# දහම් ගුණ හය

ඒහි පස්සික

ශ්‍රී සද්ධර්මයේ දැක්වෙන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කොට ධර්මයේ සත්‍යතාව වටහා ගන්නා ලෙස දැක්වීම ‘ඒහි පස්සික’ නම් වේ

# දහම් ගුණ හය

ඕපනයිකෝ

ලෝක සත්ත්වයන් සතර අපා දුකින් ගලවා දේව, මනුෂය, බ්‍රහ්ම ලෝකවල උප්පත්තිය ලබන මඟ පිළිවෙළින් ඔප් නංවන ක්‍රමය දැක්වෙන බැවින් ධර්මය ඕපනයික වේ

# දහම් ගුණ හය

පච්චත්තං වේදි තබ්බෝ විඤ්ඤූහි


ධර්මය ඥානවන්තයින් විසින් තම තමා විසින් ම පුරුදු පුහුණු කරනු ලැබිය යුතු හා අවබෝධ කරගනු ලැබිය යුතු වන බැවින් පච්චත්තං වේදි තබ්බෝ විඤ්ඤූහි නම් වේ

# ධර්ම රත්නයෙහි ඇති වැදගත්කම

- බුදුන් වහන්සේ විසින් ම තම ගුරු තනතුරෙහි ධර්ම රත්නය තබා ගැනීම
- බුදුන් වහන්සේ විසින් ආමිසයට වඩා ප්‍රතිපත්තිය උතුම් බව පෙන්වා දීම
- ධර්මය නූතන විද්‍යා ඥානය පවා අබිබවා ගොස් තිබීම
- දහම් ගුණ සිහිපත් කිරීම තුළින් අපගේ නැණ දියුණු කර ගත හැකි වීම

උදා :- - සන්දිට්ඨික ගුණයට අනුව වැඩිහිටි අවවාද අනුශාසනා පිළිපැදීමෙන්
- නිවැරදි සිරිත් පිළිපැදීමෙන්
- සාරධර්ම අනුව හැඩ ගැසීමෙන්

# සංඝ රත්නය



# සංඝ රත්නයේ ගුණ කියැවෙන පාඨය

සුපටිපන්නෝ භගවතෝ සාවක
සංඝෝ, උජුපටිපන්නෝ භගවතෝ
සාවක සංඝෝ, ඤායපටිපන්නෝ
භගවතෝ සාවක සංඝෝ
සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක
සංඝෝ යදිදං චත්තාරි පුරිස යුගානි
අට්ඨ පුරිස පුග්ගලා ඒස භගවතෝ
සාවක සංඝෝ,
ආහුණෙය්යෝ, පාහුණෙය්යෝ,
අඤ්ජලිකරණීයෝ, අනුත්තරං
පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති

# සංඝ රත්නයේ ගුණ සිහිකරන "සුපටිපන්නෝ " පාඨයේ පෙන්වා දී ඇති සඟ ගුණ නවය

1. සුපටිපන්නෝ
2. උජුපටිපන්නෝ
3. ඤායපටිපන්නෝ
4. සාමීචිපටිපන්නෝ
5. ආහුනෙයියෝ
6. පාහුනෙයියෝ
7. දක්ඛිණෙයියෝ
8. අංජලිකරණීයෝ
9. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස



# සුපටිපන්න

බුදුරදුන් විසින්
දේශනා කරන ලද
යහපත් ධර්ම මාර්ගය
අනුගමනය කිරීමෙහි
යෙදුණු බැවින්
සුපටිපන්න නම් වේ

# උජුපටිපන්න

සෘජු වූ ධර්ම මාර්ගය සෘජුව හෙවත් අවංකව අනුගමනය කිරීමෙහි යෙදුණු බැවින් උජුපටිපන්න නම් වේ

# ඤායපටිපන්න

නිවන සඳහා වන ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙහි යෙදුණු බැවින් ඤායපටිපන්න නම් වේ

# සාමීචිපටිපන්න



නිවැරදි ධර්ම මාර්ගය අනුගමනය කිරීමෙහි යෙදුණු බැවින් සාමීචිපටිපන්න නම් වේ

# ආහුණෙය්‍යය



ආරාධනා කොට
වැඩමවා
සිව්පසය පුද
කිරීමට සුදුසු
හෙයින්
ආහුණෙය්‍යය නම්
වේ

# පාහුණෙය්‍යාය



ආගන්තුකයන් සඳහා සූදානම් කළා වූ ආහාරය වුව ද පිළිගැන්වීමට සුදුසු බැවින් පැහුණෙය්‍යාය නම් වේ

# දක්ඛිණෙය්‍යා




පරලෝ සුව පතා
දෙන දානය
පිළිගැන්වීමට සුදුසු
බැවින් දක්ඛිණෙය්‍යා
නම් වේ

# අංජලිකරණීය



දොහොත් මුදුන්හි තබා නමස්කාර කිරීමට සුදුසු බැවින් අංජලිකරණීය නම් වේ

අනුත්තරං
පුඤ්ඤක්ඛෙත්තං
ලෝකස්ස



පින් කරනු කැමති ලෝවැස්සා හට උසස්තම පින් කෙත වූ බැවින් අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස නම් වේ

# මහා සංඝ රත්නය විසින් ආරක්ෂා කරනු ලබන ප්‍රතිපත්ති

- ✓ සාමණේර කාලයේ දී සාමණේර සීලය රැකීම
- ✓ උපසම්පදාවෙන් පසු ව උපසම්පදා සීලය රැකීම
- ✓ විනය ශික්ෂාවන් රැකීම (භික්ෂූන් වහන්සේලාගේ දෛනික කාර්යයන් විනය ශික්ෂාවන්ට අනුකූල ව සිදු කිරීම)

## ගිහියන් ලෙස අපට රැකිය හැකි සීලමය ප්‍රතිපත්ති

පඤ්ච සීල ප්‍රතිපත්තිය

ආජීව අෂ්ටමක සීලය

ගෘහස්ථ සීලය

## පාසල් සිසුන් වන අපට රැකිය හැකි ප්‍රතිපත්ති

- කුමර බඹසර, කුමරි බඹසර රැකීම
- මවුපියන්ට, ගුරුවරුන්ට හා වැඩිහිටියන්ට කීකරු වීම

# පඤ්චසීලය ආරක්ෂා කරගැනීමෙන් ලැබෙන වාසි

- ❖ නිවසේ සතුට, සමගිය ආරක්ෂා වීම
- ❖ ජීවිත ආරක්ෂාව හා දේපළ ආරක්ෂාව ඇති වීම
- ❖ පවුල් ජීවිතයේ ශිෂ්ටත්වය, විශ්වාසය ඇති වීම
- ❖ මනා සිහිබුද්ධිය හා සෞඛ්‍ය ආරක්ෂාව ඇති වීම

# මහා සංඝ රත්නය ඇසුරු කිරීමේ දී අප විසින් ක්‍රියා කළ යුතු ආකාරය

- මහා සංඝ රත්නය කෙරෙහි මෛත්‍රී සහගතව ක්‍රියා කිරීම
- සංඝරත්නය ගෞරවනීය ව ඇසුරු කිරීම
- ශාසනික වචන භාවිත කරමින් ඇසුරු කිරිම
- අවවාද අනුශාසනා පිළිපදිමින් ඇසුරු කිරීම

# පුහුණුවට

පෙරයම බුද්ධං සරණේ ගඤ්ඤයි
මැදියම ධම්මං සරණේ ගඤ්ඤයි
අලුයම සංඝං සරණේ ගඤ්ඤයි
තුන්යමට ම තුන් සරණේ ගඤ්ඤයි

බුද්ධං සරණේ සිරස දරාගෙන
ධම්මං සරණේ සිත පහදාගෙන
සංඝං සරණේ සිවුරු දරාගෙන
ඉඤ්ඤයි තුන් සරණේ අදහාගෙන

# තෙරුවන් සරණයි..!